# නපුරු පූසාගෙන් බේරුණු මී පැංචා



ඉනුදි මොනාරා කුමාරි පරාක්‍රම

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලඳයි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැංවීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩ ගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණ කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදිශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

සසිකලා සේනාධීර,
විදුහල්පතිනි,
මහමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.
2023.11.01

නපුරු පූසාගෙන් බේරුණු මී පැංචා කර්තෘ ප්‍රකාශනයකි.

පළමු වන මුද්‍රණය 2023 ඔක්තෝම්බර් 15

ISBN 978-624-206-769-8

Bar Code 9 786242 067698

කතාව සහ චිත්‍ර

ඉනුදි මොනාරා කුමාරි පරාක්‍රම

2 ශ්‍රේණිය A

මහමායා බාලිකා විදුහල

මහනුවර.

පිදුම

ලෙයින් කිරෙන් මා පෝෂණය කළ
අම්මාටත්

අපමන සෙනහසින් මා ඇති දැඩි කළ
තාත්තාටත්

සිප් සතර ලබා දෙන ගුරුවරුන්ටත්

සෙනෙහෙබර මා ප්‍රිය යහළු
යෙහෙළියන්ටත්

මේ පොත සදෘ ආදරයෙන් පුදමි !

ළමා සාහිත්‍ය කටයුතුවලදී දිවි දීමෙන් ළමා ලොව සුරැකීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරන මහනුවර මහමායා බාලිකා විදුහල හා ගුරු මණ්ඩලයට ගෞරවනීය ස්තූතිය පළමුව පුදකරමි.

ඉනුදි මොනාරා කුමාරි පරාක්‍රම වන මාගේ මෙම නිර්මාණය ඔබ සියලු දෙනාට රසවින්දනය කිරීමට හැකි වේවායි බලාපොරොත්තු වෙමි.

කර්තෘ

ඉනුදි මොනාරා කුමාරි පරාක්‍රම,

ස්ථිර ලිපිනය

අංක 30,බෝගහපිටිය වත්ත,

කෙන්ගල්ල,


මහනුවර.



ඒකෝමත් එක
ගමක හිටිය පුංචි
මීයෙක්. මේ මී
පැටිය හරිම ආසයි
චීස් කන්න.

මේ මී පැටියා
ලස්සන ගෙදරකට
ගියා චීස් කෑල්ලක්
හොයාගෙන.





ඒ ලස්සන ගෙදර
හිටිය ලස්සන,
කරුණාවන්ත ගෑනු
ළමයෙක්.

එයාගේ නම එමී.

එමී

මේ මී පැටියට
කන්න චීස් කෑල්ලක්
මේසෙ උඩ තියල
යනවා හැමදාම.





ඉතින් මේ මීයා
හරිම ආසාවෙන්
මේ චීස් කෑල්ල
කනවා.





දවසක්ද මේ මීයා
ආවා චීස් කෑල්ල
කන්න වෙනද
වගේම.

එද මේසෙ උඩ චීස්
කෑල්ල තිබුණේ නෑ.

මී පැටියා හරිම
දුකෙන්... කඳුලුත්
වැටුණා ....





ඊළඟ දවසේ උදේ
එමී දැක්කා හොර
පූසෙක් ඇවිත් මී
පැටියාගේ චීස්
කෑල්ල අරගෙන
ජනේලයෙන් පැනලා
දුවනවා. එමී



හිතුවා" මම හෙට
අල්ලගන්නම්කෝ
මේ නපුරු පූසාව"
කියලා..



එම් එදත් චීස් කෑල්ල
මේසය උඩ තියලා
තිබ්බා.මී පැටියා
වෙනදට වඩා කලින්
ආවා චීස් කෑල්ල
කන්න.මී පැටියා
මේසයට නැගලා චීස්
කෑල්ල කන්න පටන්
ගන්න විටදී, නපුරු
පූසා මී පැටියා
අල්ලාගන්න හෙමින්
හෙමින් ආවා.





එතකොටම එමී
පූසාව එලවන්න
ඕන නිසා කොස්සක්
අරන් එළියට
පැන්නා. මී පැංචා
චීස් කෑල්ලත් අරන්
ජනේලයෙන්
පැන්නා. නපුරු
පූසා එමීට බයේ
දුවන්න පැන්නා.





මී පැටියා කැලේට
දිව්වා. පූසා
නොපෙනෙන
තෙක්ම දිවුවා.

පූසා ගෙන් බේරුනු
මී පැටියා සතුටින්
චීස් කෑල්ල කන්න
පටන් ගත්තා.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කොට ගෙන පොතපතින් දුරස් වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම, ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟා වීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදයක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

**සෙනෙවිරත්න මහලේකම්**

**පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක**

2023.11.01